## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
### බාහිර විභාග අංශය
### වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි**

**BMGT E 3065 – ව්‍යාපාර මූල්‍ය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) ඒ.කේ.ටී.එස්. සමාගම ප්‍රමුඛපෙලේ ඇඟළුම් සමාගමක් වන අතර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උපසමාගමක් පිහිටුවමින් සමාගමේ කටයුතු පුළුල් කිරීමට තීරණය කරන ලදී. සමාගමේ මූල්‍ය කළමනාකරු වන සෙනෙවිරත්න මහතාට එම විෂය සම්බන්ධයෙන් මනා දැනුමක් සහ පළපුරුද්දක් ඇති බැවින්, නව උප සමාගම පිහිටුවීමේ සම්පූර්ණ වගකීම සෙනෙවිරත්න මහතා වෙත පැවරීම වඩාත් යෝග්‍ය බව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා (Chief Executive Officer) වන ඩයස් මහතා විසින් යෝජනා කරන ලදී. නමුත්, මෙහිදී සමාගමේ ප්‍රධාන කොටස් හිමියෙකු වූ කවිරත්න මහතා නොයෙකුත් ප්‍රශ්න නගමින් කියා සිටියේ සෙනෙවිරත්න මහතා සමාගමේ අරමුණු ඉටුකර ගැනීමට වඩා ඔහුගේ පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන බැවින්, එම උපසමාගම පිහිටුවීමේ සම්පූර්ණ වගකීම ඔහුට පැවරීම යෝග්‍ය තීරණයක් නොවන බවයි. තවදුරටත් ඔහු කියා සිටියේ සමාගමේ කළමනාකරුවන් විසින් කොටස් හිමියන්ගේ ධනය උපරිම කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවයි. නමුත් මෙහිදී සමාගමේ අලෙවි කළමනාකරු වූ සුමිත් මහතාගේ තර්කය වූයේ සමාගමක ප්‍රධාන අරමුණ විය යුත්තේ ලාභය උපරිම කිරීම බවයි.

අ) නව උප සමාගම පිහිටුවීමේ වගකීම සෙනෙවිරත්න මහතා වෙත පැවරීමේ සිද්ධිය සම්බන්ධව පවතින ගැටළුව කුමක්ද? සමාගමේ පවතින මෙම ගැටළුව විසඳීම සඳහා ඔබගේ යෝජිත විසඳුම් දක්වන්න.

(ලකුණු 06)

ආ) සමාගමේ මූල්‍ය කළමනාකරු ලෙස, සෙනෙවිරත්න මහතා නව සමාගම පිහිටුවීමේදී ගතයුතු ප්‍රධාන තීරණයන් මොනවාද?

(ලකුණු 06)

ඇ) සුමිත් මහතා සහ කවිරත්න මහතා නැගූ තර්කයන් පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

(02) අ) සමාගමක් රු. 200,000 ක් වසර 2 ක් සඳහා බැංකුවක් වෙතින් ණයට ගැනීමට අපේක්ෂා කරයි. "A" බැංකුව විසින් වාර්ෂිකව 18.4% ක් වූ අර්ධවාර්ෂිකව වර්ධනය වන (compounded semi-annually) පොලී අනුපාතයක් යටතේ ණය මුදල් ලබා දෙයි. "B" බැංකුව වාර්ෂික 18.2% ක් වූ කාර්තුමය වශයෙන් වර්ධනය වන (compounded quarterly) පොලී අනුපාතයක් මත ණය මුදල් ලබා දෙයි. "C" බැංකුව 19.6% ක

වාර්ෂිකව වර්ධනය වන (compounded annually) පොලී අනුපාතයක් මත ණය මුදල් ලබා දෙයි. සමාගම විසින් ණය මුදල් ලබාගත යුත්තේ කුමන බැංකුවක් වෙතින්ද? සමාගමට උපදෙස් දෙන්න.

(ලකුණු 05)

ආ) පෙරේරා මහත්මිය විසින්, ඇගේ රැකියා කාලය තුලදී ඉතිරිකරගත් රු. 250,000 ක් බැංකුවක ඇති අතර ඇය දැනට විශ්‍රාම ගැනීමට සැලසුම්කරමින් සිටී. ඇයගේ ජීවිතයේ ඉදිරි වසර 25 සඳහා මෙම ඉතුරුම් වලින්, සමාන වාරික වශයෙන් මුදල් ආපසු ලබා ගැනීමට ඇය අපේක්ෂා කරයි. ඇගේ ඉතුරුම් මත 5% ක වාර්ෂික පොලියක් ලැබෙන්නේ නම් අදාල වාරිකය කොපමණද?

(ලකුණු 05)

ඇ) අරුණළු මහතා ඔහුගේ කර්මාන්තශාලාව සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීමේ අරමුණින් 3% ක මාසික පොලියක් මත රු. 90,000 ක් ණයට ගැනීමට අපේක්ෂා කරයි. එම ණය ඒ ඒ මාසය අවසානයේදී ගෙවනු ලබන සමාන මාසික වාරික 6 කින් ආපසු ගෙවිය යුතු වේ. ණය ක්‍රම ක්ෂය උපලේඛනයක් (Loan Amortization Schedule) පිළියෙල කරන්න.

(ලකුණු 05)

ඈ) අමරසූරිය මහතා 8% ක නාමික පොලී අනුපාතයක් සහිත, සම මිල රු. 1000 ක් වූ පස් අවුරුදු බැඳුම්කරයක් මිලදී ගැනීමට සලකාබලමින් සිටියි. අමරසූරිය මහතාගේ ඇවැයි ප්‍රතිලාභ අනුපාතය (Required rate of return) 9% කි. බැඳුම්කරණය සම මිලට කල්පිරෙන්නේ නම්, බැඳුම්කරණය මිලදී ගැනීම සඳහා අමරසූරිය මහතා වර්තමානයේදී ගෙවීමට සූදානම් මුදල කොපමණක් විය යුතුද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(03) 2010 වර්ෂයේදී නීලගිරි සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය පහත පරිදි වේ.

| | රු. 000' |
|---|---|
| රු. 1.00 බැගින් වූ සාමාන්‍ය කොටස් 1,000,000 | 1,000 |
| රු. 0.50 බැගින් වූ වරණීය කොටස් 400,000 | 200 |
| රු. 100 බැගින් වූ 9% නිදහස් කළ හැකි ණයකර | 200 |
| 8% දිගුකාලීන ණය | 200 |
| එකතුව | 1,600 |

සාමාන්‍ය කොටසක වර්තමාන වෙළඳපොල අගය රු. 1.20 ක් වන අතර 6% ක ලාභාංශයක් නොබෝදා ගෙවා ඇත. ලාභාංශ වර්ධනය වර්ෂයකට 11% ක් යැයි අපේක්ෂා කරයි. සාමාන්‍ය කොටස් නිකුත් කිරීමේ වියදම කොටසකට රු. 0.10 ක් වේ. වරණීය කොටස් වල වර්තමාන වෙළඳපොල අගය කොටසකට රු. 0.70 ක් වන අතර, ලාභාංශ අනුපාතය 8% කි. 9% නිදහස් කළහැකි ණයකරවල වර්තමාන වෙළඳපොල මිල රු. 90 ක් වන අතර වසර 8 කින් නිදහස් කළ යුතු වේ. සමාගම් බදු අනුපාතය 30% ක් යැයි උපකල්පනය කරන්න.

අ) වෙළඳපොල අගයන් පදනම් කරගනිමින්, සීමිත නීලගිරි සමාගමේ බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (Weighted Average Cost of Capital) ගණනය කරන්න.

(ලකුණු 15)

ආ) "ව්‍යාපෘති ප්‍රාග්ධන පිරිවැය සැමවිටම ආයතනයක බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැයට වඩා වැඩිය."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

(04) අ) සීමිත කැන්ඩි ටෙරා සමාගම හා සම්බන්ධ පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| විකුණුම් මිල | රු. 10 |
| ඒකකයක් සඳහා විචල්‍ය පිරිවැය | රු. 6 |
| ස්ථාවර මෙහෙයුම් පිරිවැය | රු. 120,000 |
| පොලී ගෙවීම් | රු. 40,000 |
| වර්තමාන මෙහෙයුම් මට්ටම | ඒකක 50,000 |

ඔබ විසින් කැන්ඩි ටෙරා සමාගම සඳහා පහත තෝලන මට්ටම් ගණනය කරන්න.

(i) මෙහෙයුම් තෝලන මට්ටම (Degree of Operating Leverage)

(ii) මූල්‍ය තෝලන මට්ටම (Degree of Financial Leverage)

(iii) මුළු තෝලන මට්ටම (Degree of Total Leverage)

(ලකුණු 05)

ආ) ආයතනයකට එහි අවදානම් ප්‍රභේදනය කළ හැක්කේ කෙසේද යන්න විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ) ස්කන්ධ ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කර ඒ එකිනෙකෙහි වාසි අවාසි විස්තර කරන්න.

(ලකුණු 05)

ඈ) තොරතුරුමය වෙළඳපොල කාර්යක්ෂමතාවයන් ආකාර තුන ලැයිස්තුගත කර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

(05) පහත ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) මූලික විශ්ලේෂණය (Fundamental Analysis) හා තාක්ෂණික විශ්ලේෂණය (Technical Analysis)

ආ) ලාභාංශ ප්‍රතිපත්තිය

ඇ) EBIT - EPS විශ්ලේෂණය

ඈ) ආදේශක හුවමාරුවීමේ න්‍යාය (Trade - off Theory) සහ සංඥා දක්වීමේ න්‍යාය (Signaling Theory)

(මුළු ලකුණු 20)

TABLE 2 THE PRESENT VALUE OF RS.1 @ 1% FOR n YEARS

| n \ i | 2.5 | 3.0 | 4.0 | 5.0 | 6.0 | 7.0 | 8.0 | 9.0 | 10.0 | 11.0 | 12.0 | 14.0 | 15.0 | 16.0 | 18.0 | 20.0 | 25.0 | 30.0 | 35.0 | 40.0 | 45.0 | 50.0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | .9756 | .9709 | .9615 | .9524 | .9434 | .9346 | .9259 | .9174 | .9091 | .9009 | .8929 | .8772 | .8696 | .8621 | .8475 | .8333 | .8000 | .7692 | .7407 | .7143 | .6897 | .6667 |
| 2 | .9518 | .9426 | .9246 | .9070 | .8900 | .8734 | .8573 | .8417 | .8264 | .8116 | .7972 | .7695 | .7561 | .7432 | .7182 | .6944 | .6400 | .5917 | .5487 | .5102 | .4756 | .4444 |
| 3 | .9286 | .9151 | .8890 | .8638 | .8396 | .8163 | .7938 | .7722 | .7513 | .7312 | .7118 | .6750 | .6575 | .6407 | .6086 | .5787 | .5120 | .4552 | .4064 | .3644 | .3280 | .2963 |
| 4 | .9060 | .8885 | .8548 | .8227 | .7921 | .7629 | .7350 | .7084 | .6830 | .6587 | .6355 | .5921 | .5718 | .5523 | .5158 | .4823 | .4096 | .3501 | .3011 | .2603 | .2262 | .1975 |
| 5 | .8839 | .8626 | .8219 | .7835 | .7473 | .7130 | .6806 | .6499 | .6209 | .5935 | .5674 | .5194 | .4972 | .4761 | .4371 | .4019 | .3277 | .2693 | .2230 | .1859 | .1560 | .1317 |
| 6 | .8623 | .8375 | .7903 | .7462 | .7050 | .6663 | .6302 | .5963 | .5645 | .5346 | .5066 | .4556 | .4323 | .4104 | .3704 | .3349 | .2621 | .2072 | .1652 | .1328 | .1076 | .0878 |
| 7 | .8413 | .8131 | .7599 | .7107 | .6651 | .6227 | .5835 | .5470 | .5132 | .4817 | .4523 | .3996 | .3759 | .3538 | .3139 | .2791 | .2097 | .1594 | .1224 | .0949 | .0742 | .0585 |
| 8 | .8207 | .7894 | .7307 | .6768 | .6274 | .5820 | .5403 | .5019 | .4665 | .4339 | .4039 | .3506 | .3269 | .3050 | .2660 | .2326 | .1678 | .1226 | .0906 | .0678 | .0512 | .0390 |
| 9 | .8007 | .7664 | .7026 | .6446 | .5919 | .5439 | .5002 | .4604 | .4241 | .3909 | .3606 | .3075 | .2843 | .2630 | .2255 | .1938 | .1342 | .0943 | .0671 | .0484 | .0353 | .0260 |
| 10 | .7812 | .7440 | .6756 | .6139 | .5584 | .5083 | .4632 | .4224 | .3855 | .3522 | .3220 | .2697 | .2472 | .2267 | .1911 | .1615 | .1074 | .0725 | .0497 | .0346 | .0243 | .0173 |
| 11 | .7621 | .7224 | .6496 | .5847 | .5268 | .4751 | .4289 | .3875 | .3505 | .3173 | .2875 | .2366 | .2149 | .1954 | .1619 | .1346 | .0859 | .0558 | .0368 | .0247 | .0168 | .0116 |
| 12 | .7436 | .7014 | .6246 | .5568 | .4970 | .4440 | .3971 | .3555 | .3186 | .2858 | .2567 | .2076 | .1869 | .1685 | .1372 | .1122 | .0687 | .0429 | .0273 | .0176 | .0116 | .0077 |
| 13 | .7254 | .6810 | .6006 | .5303 | .4688 | .4150 | .3677 | .3262 | .2897 | .2575 | .2292 | .1821 | .1625 | .1452 | .1163 | .0935 | .0550 | .0330 | .0202 | .0126 | .0080 | .0051 |
| 14 | .7077 | .6611 | .5775 | .5051 | .4423 | .3878 | .3405 | .2992 | .2633 | .2320 | .2046 | .1597 | .1413 | .1252 | .0985 | .0779 | .0440 | .0254 | .0150 | .0090 | .0055 | .0034 |
| 15 | .6905 | .6419 | .5553 | .4810 | .4173 | .3624 | .3152 | .2745 | .2394 | .2090 | .1827 | .1401 | .1229 | .1079 | .0835 | .0649 | .0352 | .0195 | .0111 | .0064 | .0038 | .0023 |
| 16 | .6736 | .6232 | .5339 | .4581 | .3936 | .3387 | .2919 | .2519 | .2176 | .1883 | .1631 | .1229 | .1069 | .0930 | .0708 | .0541 | .0281 | .0150 | .0082 | .0046 | .0026 | .0015 |
| 17 | .6572 | .6050 | .5134 | .4363 | .3714 | .3166 | .2703 | .2311 | .1978 | .1696 | .1456 | .1078 | .0929 | .0802 | .0600 | .0451 | .0225 | .0116 | .0061 | .0033 | .0017 | .0010 |
| 18 | .6412 | .5874 | .4936 | .4155 | .3503 | .2959 | .2502 | .2120 | .1799 | .1528 | .1300 | .0946 | .0808 | .0691 | .0508 | .0376 | .0180 | .0089 | .0045 | .0023 | .0012 | .0007 |
| 19 | .6255 | .5703 | .4746 | .3957 | .3305 | .2765 | .2317 | .1945 | .1635 | .1377 | .1161 | .0829 | .0703 | .0596 | .0431 | .0313 | .0144 | .0068 | .0033 | .0017 | .0009 | .0005 |
| 20 | .6103 | .5537 | .4564 | .3769 | .3118 | .2584 | .2145 | .1784 | .1486 | .1240 | .1037 | .0728 | .0611 | .0514 | .0365 | .0261 | .0115 | .0053 | .0025 | .0012 | .0006 | .0003 |
| 21 | .5954 | .5375 | .4388 | .3589 | .2942 | .2415 | .1987 | .1637 | .1351 | .1117 | .0926 | .0638 | .0531 | .0443 | .0309 | .0217 | .0092 | .0040 | .0018 | .0009 | .0004 | .0002 |
| 22 | .5809 | .5219 | .4220 | .3418 | .2775 | .2257 | .1839 | .1501 | .1228 | .1007 | .0826 | .0560 | .0462 | .0382 | .0262 | .0181 | .0074 | .0031 | .0014 | .0006 | .0003 | .0001 |
| 23 | .5667 | .5067 | .4057 | .3256 | .2618 | .2109 | .1703 | .1378 | .1117 | .0907 | .0738 | .0491 | .0402 | .0329 | .0222 | .0150 | .0059 | .0024 | .0010 | .0004 | .0002 | .0001 |
| 24 | .5529 | .4919 | .3901 | .3101 | .2470 | .1971 | .1577 | .1264 | .1015 | .0817 | .0659 | .0431 | .0349 | .0284 | .0188 | .0126 | .0047 | .0018 | .0007 | .0003 | .0001 | [illegible] |
| 25 | .5394 | .4776 | .3751 | .2953 | .2330 | .1842 | .1460 | .1160 | .0923 | .0736 | .0588 | .0378 | .0304 | .0245 | .0160 | .0105 | .0038 | .0014 | .0006 | [illegible] | [illegible] | .0000 |

## TABLE 3 THE PRESENT VALUE OF AN IMMEDIATE ANNUAL ANNUITY OF RS1 FOR n YEARS

| n \ i | 6.0 | 7.0 | 8.0 | 9.0 | 10.0 | 11.0 | 12.0 | 14.0 | 15.0 | 16.0 | 18.0 | 20.0 | 25.0 | 30.0 | 35.0 | 40.0 | 45.0 | 50.0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | .9434 | .9346 | .9259 | .9174 | .9091 | .9009 | .8929 | .8772 | .8696 | .8621 | .8475 | .8333 | .8000 | .7692 | .7407 | .7143 | .6897 | .6666 |
| 2 | 1.8334 | 1.8080 | 1.7833 | 1.7591 | 1.7355 | 1.7125 | 1.6901 | 1.6467 | 1.6257 | 1.6052 | 1.5656 | 1.5278 | 1.4400 | 1.3609 | 1.2894 | 1.2245 | 1.1653 | 1.1111 |
| 3 | 2.6730 | 2.6243 | 2.5771 | 2.5313 | 2.4869 | 2.4437 | 2.4018 | 2.3216 | 2.2832 | 2.2459 | 2.1743 | 2.1065 | 1.9520 | 1.8161 | 1.6959 | 1.5889 | 1.4933 | 1.4074 |
| 4 | 3.4651 | 3.3872 | 3.3121 | 3.2397 | 3.1699 | 3.1024 | 3.0373 | 2.9137 | 2.8550 | 2.7982 | 2.6901 | 2.5887 | 2.3616 | 2.1662 | 1.9969 | 1.8492 | 1.7195 | 1.6049 |
| 5 | 4.2124 | 4.1002 | 3.9927 | 3.8897 | 3.7908 | 3.6959 | 3.6048 | 3.4331 | 3.3522 | 3.2743 | 3.1272 | 2.9906 | 2.6893 | 2.4356 | 2.2200 | 2.0352 | 1.8755 | 1.7366 |
| 6 | 4.9173 | 4.7665 | 4.6229 | 4.4859 | 4.3553 | 4.2305 | 4.1114 | 3.8887 | 3.7845 | 3.6847 | 3.4976 | 3.3255 | 2.9514 | 2.6427 | 2.3852 | 2.1680 | 1.9831 | 1.8244 |
| 7 | 5.5824 | 5.3893 | 5.2064 | 5.0330 | 4.8684 | 4.7122 | 4.5638 | 4.2883 | 4.1604 | 4.0386 | 3.8115 | 3.6046 | 3.1611 | 2.8021 | 2.5075 | 2.2628 | 2.0573 | 1.8829 |
| 8 | 6.2098 | 5.9713 | 5.7466 | 5.5348 | 5.3349 | 5.1461 | 4.9676 | 4.6389 | 4.4873 | 4.3436 | 4.0776 | 3.8372 | 3.3289 | 2.9247 | 2.5982 | 2.3306 | 2.1085 | 1.9220 |
| 9 | 6.8017 | 6.5152 | 6.2469 | 5.9952 | 5.7590 | 5.5370 | 5.3282 | 4.9464 | 4.7716 | 4.6065 | 4.3030 | 4.0310 | 3.4631 | 3.0190 | 2.6653 | 2.3790 | 2.1438 | 1.9480 |
| 10 | 7.3601 | 7.0236 | 6.7101 | 6.4177 | 6.1446 | 5.8892 | 5.6502 | 5.2161 | 5.0188 | 4.8332 | 4.4941 | 4.1925 | 3.5705 | 3.0915 | 2.7150 | 2.4136 | 2.1681 | 1.9653 |
| 11 | 7.8869 | 7.4987 | 7.1390 | 6.8052 | 6.4951 | 6.2065 | 5.9377 | 5.4527 | 5.2337 | 5.0286 | 4.6560 | 4.3271 | 3.6564 | 3.1473 | 2.7519 | 2.4383 | 2.1849 | 1.9769 |
| 12 | 8.3838 | 7.9427 | 7.5361 | 7.1607 | 6.8137 | 6.4924 | 6.1944 | 5.6603 | 5.4206 | 5.1971 | 4.7932 | 4.4392 | 3.7251 | 3.1903 | 2.7792 | 2.4559 | 2.1965 | 1.9846 |
| 13 | 8.8527 | 8.3577 | 7.9038 | 7.4869 | 7.1034 | 6.7499 | 6.4235 | 5.8424 | 5.5831 | 5.3423 | 4.9095 | 4.5327 | 3.7801 | 3.2233 | 2.7994 | 2.4685 | 2.2045 | 1.9897 |
| 14 | 9.2950 | 8.7455 | 8.2442 | 7.7862 | 7.3667 | 6.9819 | 6.6282 | 6.0021 | 5.7245 | 5.4675 | 5.0081 | 4.6106 | 3.8241 | 3.2487 | 2.8144 | 2.4775 | 2.2100 | 1.9931 |
| 15 | 9.7122 | 9.1079 | 8.5595 | 8.0607 | 7.6061 | 7.1909 | 6.8109 | 6.1422 | 5.8474 | 5.5755 | 5.0916 | 4.6755 | 3.8593 | 3.2682 | 2.8255 | 2.4839 | 2.2138 | 1.9954 |
| 16 | 10.1059 | 9.4466 | 8.8514 | 8.3126 | 7.8237 | 7.3792 | 6.9740 | 6.2651 | 5.9542 | 5.6685 | 5.1624 | 4.7296 | 3.8874 | 3.2832 | 2.8337 | 2.4885 | 2.2164 | 1.9970 |
| 17 | 10.4773 | 9.7632 | 9.1216 | 8.5436 | 8.0216 | 7.5488 | 7.1196 | 6.3729 | 6.0472 | 5.7487 | 5.2223 | 4.7746 | 3.9099 | 3.2948 | 2.8398 | 2.4918 | 2.2182 | 1.9980 |
| 18 | 10.8276 | 10.0591 | 9.3719 | 8.7556 | 8.2014 | 7.7016 | 7.2497 | 6.4674 | 6.1280 | 5.8178 | 5.2732 | 4.8122 | 3.9279 | 3.3037 | 2.8443 | 2.4941 | 2.2195 | 1.9986 |
| 19 | 11.1581 | 10.3356 | 9.6036 | 8.9501 | 8.3649 | 7.8393 | 7.3658 | 6.5504 | 6.1982 | 5.8775 | 5.3162 | 4.8435 | 3.9424 | 3.3105 | 2.8476 | 2.4958 | 2.2203 | 1.9991 |
| 20 | 11.4699 | 10.5940 | 9.8181 | 9.1285 | 8.5136 | 7.9633 | 7.4694 | 6.6231 | 6.2593 | 5.9288 | 5.3527 | 4.8696 | 3.9539 | 3.3158 | 2.8501 | 2.4970 | 2.2209 | 1.9994 |
| 21 | 11.7641 | 10.8355 | 10.0168 | 9.2922 | 8.6487 | 8.0751 | 7.5620 | 6.6870 | 6.3125 | 5.9731 | 5.3837 | 4.8913 | 3.9631 | 3.3198 | 2.8519 | 2.4979 | 2.2213 | 1.9996 |
| 22 | 12.0416 | 11.0612 | 10.2007 | 9.4424 | 8.7715 | 8.1757 | 7.6446 | 6.7429 | 6.3587 | 6.0113 | 5.4099 | 4.9094 | 3.9705 | 3.3230 | 2.8533 | 2.4985 | 2.2216 | 1.9997 |
| 23 | 12.3034 | 11.2722 | 10.3711 | 9.5802 | 8.8832 | 8.2664 | 7.7184 | 6.7921 | 6.3988 | 6.0442 | 5.4321 | 4.9245 | 3.9764 | 3.3254 | 2.8543 | 2.4989 | 2.2218 | 1.9998 |
| 24 | 12.5504 | 11.4693 | 10.5288 | 9.7066 | 8.9847 | 8.3481 | 7.7843 | 6.8351 | 6.4338 | 6.0726 | 5.4509 | 4.9371 | 3.9811 | 3.3272 | 2.8550 | 2.4992 | 2.2219 | 1.9999 |
| 25 | 12.7834 | 11.6536 | 10.6748 | 9.8226 | 9.0770 | 8.4217 | 7.8431 | 6.8729 | 6.4641 | 6.0971 | 5.4669 | 4.9476 | 3.9849 | 3.3286 | 2.8556 | 2.4994 | 2.2220 | 1.9999 |